සන්නස
SANNASA

# ආලින්දය

## අද ශ්‍රී ලංකාවේ 5 වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා

සාකච්ඡා කළේ චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

සන්නස පුවත්පතෙහි ඉල්ලීමකට අනුව 2019 අගෝස්තු පලමුවෙනි දින උදෑසන නමයට පැමිණෙන ලෙස මහින්ද රාජපක්ෂ මැතිතුමා මා වෙත දැන්විය. ඒ අනුව එතුමාගේ විජේරාම නිල නිවසට උදෑසන 8.45 ට පමණ මම ගියෙමි. හරියටම උදෑසන නමයට එතුමා මා කැඳවීය. විනාඩි 10 ක පමණ සතුටු සාමීචිය කින් පසුව මම සන්නස පුවත්පතේ ප්‍රශ්ණාවලිය එතුමන්ට ඉදිරිපත් කළෙමි.

ප්‍රශ්නය- යුද්ධය තිබු කාලයටත් වඩා ආර්ථිකය පහලට වැටිලා තිබෙන තත්වයක තමයි දැන් අප ඉන්නේ. ඒ කාලේ ආර්ථික වර්ධන වේගය හයට ආසන්නවයි තිබුණේ. අද එය 3 දක්වා පහළ වැටිලා. මෙවන් බිහිසුණු ලෙස බිඳවැටුණු ආර්ථිකයක් ඔබතුමාගේ රජයක් යටතේ මහජනතාව පීඩාවට පත් නොකොට ගොඩ නංවන්නේ කෙසේද?

පිළිතුර - මුළින්ම අප රටේ ආරක්ෂාව තහවුරු කළ යුතුව තිබෙනවා. මේ සඳහා දැනට අක්‍රිය සේවයේ යොදවා ඇති පළපුරුදු බුද්ධි අංශ නිලධාරීන් නැවත සක්‍රිය සේවයේ යොදවා නිසියාකාරව නිවැරදි තොරතුරු ලබා ගනිමින් විද්‍යානුකූලව ආරක්ෂක අංශය මෙහෙයවීමට බලාපොරොත්තු වෙනවා. සිදුවන ඉතා සුළු අත්වැරැද්දකින් පවා මහත් විනාශයක් විය හැකි බව මා හොඳාකාරව දන්නවා. රටේ ආරක්ෂාව ඉතා යහපත් බවට තහවුරු වූ පසුව අපේ රටට ආයෝජකයින් ගෙන්වා ගැනීම පහසු වෙනවා. ජේ ආර් ජයවර්ධන මහතාගේ පාලන කාලයේ සිට ලංකාවට අති විශාල ණය ප්‍රමාණයක් අරගෙන තිබෙන නිසා විදේශ ආයෝජන වලින් තොරව ආර්ථිකය ගොඩනැංවීම අපහසුයි. ඒ යුගයේ ණය ගැනීම සඳහා ඉදිරිපත් කළ ශක්‍යතා වාර්තා වලට අනුව එම ව්‍යාපෘතිවලින් ණය ආපසු ගෙවා නැහැ. මේ හේතුවෙන් ණය ගෙවීමටත් ඒ අයට තව තව ණය ගැනීමට සිදුවුනා. අපේ කාලයේ ලබාගත් ණය මුදල් වලින් ඇරඹූ සියලුම ව්‍යාපෘති වලින් නියමිත දිනවලදී ණය ගෙවීමට හා අරමුණු ඉෂ්ට කර ගැනීමට පුළුවන් වූයේ එදා අපේ තිබූ නිවැරදි කළමනාකාරීත්වය නිසා. යුද්ධය සඳහා අප ගත් ණය මුදල් වලින් එහි අරමුණු බලාපොරොත්තු වූවාටත් වඩා කලින් ඉටු කළත් එය ණය ආපසු ගෙවීම සඳහා වූ ව්‍යාපෘතියක් නොවේ. ඉන් බලාපොරොත්තු වුණේ රටේ ජීවිත හා ධනය විශාල වශයෙන් විනාශ වී යෑම වැළැක්වීමයි . නොරොච්චෝලේ විදුලි බලාගාරය, අධිවේගී මාර්ග තැනීම සඳහා ගත් ණය මුදල් මීට වසර දෙකකට පෙර උපයා අවසන් බව මහබැංකුව නිවේදනය කළා. ඒවායින් ණය මුදල් ගෙව්වා දැයි මම දන්නෙ නෑ. මාගම්පුර වරාය ව්‍යාපෘතිය අපි පටන් ගත්තේ විශාල බලාපොරොත්තු ඇතිව. එම වරායේ භූගෝලීය පිහිටීම කෙතරම් වැදගත් දැයි ලංකාවට නොපැමිණ ඒ ආසන්නයෙන් ගමන් කරන අති විශාල නැව් සංඛ්‍යාව ගැන ලෝක සිතියම අරගෙන බැලුවොත් ඔබට වටහා ගත හැකියි. ඒ සඳහා ඉතිරි වැඩ කොටස් කිරීමට පෙරාතුව අප රජය පෙරලුනා. එහෙම වැදගත්කමක් නැත්නම් චීනය ඔය වරාය ගනීවිද? ඒ වගේම වරාය නගරය ව්‍යාපෘතිය ලංකාවට අති විශාල ආදායමක් ලබාගත හැකි වැඩපිළිවෙලක්. අපෙ රජය දිගටම පැවතුණා නම් මේ වන විට එහි වැඩ අවසන් කොට වසර දෙකකට වැඩියි. දැන් එහි ප්‍රතිලාභ භුක්ති විඳින යුගය. අපේ රට සංචාරක පාරාදීසයක් බව මුළු ලෝකයම අවිවාදයෙන් පිලිගන්නවා මෙය පූර්ණ ආරක්ෂිත රටක් බවට ලෝකය පිළිගැනීම සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට මහත් රුකුලක්. සමහර කාන්තාර ඇති රටවල් කාන්තාරය පෙන්වා සංචාරකයින් ආකර්ශනය කරගන්නවා. සංචාරකයින් ආශා කරන කොපමණ දේවල් අප රටේ තියෙනවද? අනෙක් කරුණ සංචාරකයින්ට සපයන බොහොමයක් භාණ්ඩ අපි පිටරටින් ආනයනය කරන ලද ඒවා.

ඉතිං මේ ව්‍යාපාරයෙන් උපරිම ඵල ලබන්නට නම් ඔවුන්ගේ අවශ්‍යතාවයන් හැකිතාත් මෙහිම නිපදවීමට කටයුතු කළ යුතුයි. රජයේ මැදිහත් වීමෙන් ඇඟලුම් කර්මාන්ත සඳහා විදේශ මිලදී ගන්නන් මෙහි කැඳවීමට අපි වැඩපිළිවෙළක් සකසනවා. 2015 වන විට අප රට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබුණේ. අප යළිත් ඒ තත්වය ඇති කරනවා.

ගම්බද ප්‍රදේශවල ගෘහණියන්ගේ අපතේ යන කාලය උපයෝගී කරගනිමින් පහසු යන්ත්‍රසූත්‍ර හඳුන්වා දෙමින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය හා ග්‍රාමීය ප්‍රදේශවල විශාල වශයෙන් අපතේ යන කොස් දෙල් පලතුරු ආදියෙන් කරන නිෂ්පාදන අපනයනය කිරීම ආදී ව්‍යාපෘති ද සේවාවන් සඳහා යෙදී ඇති තරුණ ශ්‍රමය ඊට වඩා ඵලදායි නිෂ්පාදන කටයුතු සඳහා යොමු කිරීමද ත්‍රිරෝද රථවල අපතේ යන තරුණයන්ගේ කාලය ඊට වඩා ආදායම් ලබාගත හැකි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමද ආදී ක්‍රමවේද මගින් මහජනයා පීඩාවට පත් නොකොට ආර්ථික වර්ධනයක් පහසුවෙන් ඇති කළ හැකියි. චීනය ජපානය වැනි ආර්ථික වශයෙන් දියුණු රටවල් වල මෙම ක්‍රමවේද අනුග මනය කරනවා. දේශගුණික කාලගුණික තත්වයන් අතින් ඉතා යහපත් අප රට ඉතා පහසුවෙන් සංවර්ධිත රටක් බවට පත්කළ හැකියි. අවශ්‍ය වන්නේ ඒ පිළිබඳව හැඟීම උවමනාව හා නිවැරැදි නායකත්වයයි.

ඔබතුමාගෙන් මීළඟට අසන්නට සිටියේ රටේ ආරක්ෂාව සැලසීම සම්බන්ධව. ඊට අදාල බොහොමයක් කරුණු ඔබතුමාගේ පිළිතුරෙන් ලැබුණ නිසා මම ඊළඟ ප්‍රශ්නයට යනවා.

ප්‍රශ්නය- විකුණා දැමූ රටේ සම්පත් යළි ලබා ගැනීමට හැකිවේද? ඒ කෙසේද ?

පිළිතුර -අපේ රටට ඉතා විශාල ආදායමක් උපයා ගැනීමට තිබූ වටිනාම සම්පතක් වන මාගම්පුර වරාය මේ රජය චීනයට පවරා දුන්නා. මේ හේතුව නිසා අමනාප වූ ඉන්දියාව හා ඇමෙරිකාව බැලන්ස් කරගැනීමටය කියමින් කොළඹ වරායේ නැගෙ නහිර ජැටියත්, රට මැදට වන්නට විශාල ඉඩම් ප්‍රමාණයකුත්, ත්‍රිකුණාමලය තෙල් ටැං කි ටිකත් මත්තල ගුවන් තොටුපලත් ඉතා ඉක්මනින් ඇමරිකාවට හා ඉන්දියාවට පවරා දෙන්නට යනවා. මෙය රටට ඉතා අයහපත් තත්ත්වයක්.



පසුගිය ඔක්තෝම්බර් මාසයේ අපේ රජයක් පිහිටුවාගෙන වහාම පාර්ලිමේන්තුව විසුරුවන්න කටයුතු කළේ රට මේ විනාසයෙන් වලක්වාගන්නට. එහෙත් අවාසනාවකට එය එසේ කරගැනීමට නොහැකි වුණා. රටේ ප්‍රදේශ පැවරීමේ ගිවිසුම් අවලංගු කිරීම අපහසුයි. එසේ වුවත් එදා උතුරු නැගෙනහිර ප්‍රභාක රන්ට පවරා දීමේ ගිවිසුම අපි අහෝසි කලා. එමෙන්ම රක්ෂණ සංස්ථාව එයා ලංකා ආයතන ද පසුගිය අපේ රජය යටතේ අපට යළි ලබා ගැනීමට හැකි වුණා. එලෙසම චීනය සමඟ සාකච්ජා කොට මාගම්පුර වරායත් වෙනත් ඉඩම් හෝ දේපල වෙනත් රටකට පවා දුනහොත් ඒවාත් සාකච්ජා කොට ලබාගත හැකි වේ යැයි මා විශ්වාස කරනවා.

ප්‍රශ්නය- විදේශ වලින් අප රටට කසල ආනයනය කොට මේ රට කසල ගොඩක් බවට පත් කරමින් තිබෙනවා. ඔබ තුමාගේ පාලන කාලය තුළ සකස් කළ අණපනත් මේ සඳහා හේතු වූ බව එජාපය සහ ජවිපෙ චෝදනා කරනවා.

පිළිතුර- ආයෝජන මණ්ඩලය යටතේ ඇති අපනයනක රුවන්ගේ පහසුව සඳහා අපි අණපනත් සම්මත කළා තමයි. ඒත් ඒ කිසිම පනතකින් රටට අහිතකර කිසිම දෙයක් ආනයනය කිරීමට කිසිදු ඉඩකඩක් ලැබෙන්නේ නැහැ. මෙය පවතින

20 වන පිටට